# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2428/13 – 2025 මාර්තු මස 19 වැනි බදාදා – 2025.03.19**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/2012 (VI).

**1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත**

1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ 29 වන වගන්තිය යටතේ ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**රාමලිංගම් චන්ද්‍රසේකර්,**
ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍ය.

2025 මාර්තු මස 04 වන දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2025 අංක 1 දරන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) (මෙහි මින් මතු "යෝජනා ක්‍රමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ දායකයකු වශයෙන් බැඳීම සඳහා වූ ඉල්ලීමක් පනතේ 5 වන වගන්තිය යටතේ යෝජනා ක්‍රමයට බැඳීමට සුදුසුකම් ඇති ධීවරයකු විසින් (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන්

ලබා ගත යුතු ආකෘති පත්‍ර මගින් (මෙහි මින් මතු “අධ්‍යක්ෂ ජනරාල්වරයා” යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මේ කාර්යය සඳහා බලය ලබා දෙන ලද නිලධාරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ඉල්ලුම්පත්‍රය ලැබුණු විට බලයලත් නිලධරයා විසින්, ඉල්ලුම් පත්‍රයේ ඇතුළත් තොරතුරුවල සත්‍යතාව තහවුරු කර එම ඉල්ලුම් පත්‍රය නිවැරදි බවට සහතික කොට, සාමාජිකත්වය ප්‍රදානය කිරීම සඳහා නිර්දේශ ලබාදීමට අධ්‍යක්ෂ ජනාරාල්වරයා විසින් විශේෂයෙන් බලය දෙන ලද නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) සාමාජිකත්වය ප්‍රදානය කිරීම සඳහා නිර්දේශ ලබාදීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද නිලධරයා විසින්, එම ඉල්ලුම්පත්‍රය සුපරීක්ෂණයට ලක්කර, ඒ සඳහා ඔහුගේ නිර්දේශය ද සමඟ එය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. මණ්ඩලය විසින්, සාමාජිකත්වය ප්‍රදානය කිරීම අනුමත කරනු ලැබූ විට, ඒ නිලධරයා විසින් ඒ සෑම දායකයකු වෙත සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) අවස්ථාවෝචිත පරිදි, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ හෝ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ බලයලත් නිලධරයකු විසින්, ඉල්ලුම් පත්‍රයේ ඇතුළත් තොරතුරුවල නිරවද්‍යතාව සහ සත්‍යතාව පිළිබඳව මෙන්ම ඉල්ලුම්කරුගේ විශ්වසනීයත්වය සහ සුදුසුකම් සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීම අවශ්‍ය වන්නා වූ ඇතැම් අවස්ථාවන්හිදී, එම ඉල්ලුම්පත්‍රය සැළකිල්ලෙන් සුපරීක්ෂණයට ලක්කළ යුතු ය.

(5) (4) වන අනු නියෝගය යටතේ ඇතැම් විට විමර්ශන සිදු කිරීමට අවශ්‍ය වූ විට, දවසේ කවර හෝ වේලාවක ශ්‍රී ලංකා ජල තීරයේ යම් ස්ථානයකට ප්‍රවේශවීමට සහ යම් ධීවර බෝට්ටුවක් හෝ ධීවර දැලක්, ධීවර ගොවිපලක්, ධීවර කොටුවක්, ධීවර උගුලක්, මසුන් ඇති කරන හෝ සකස් කරන ස්ථානයක් හෝ පරිශ්‍රයක් හෝ ධීවර හෝ ජලජීවී වගා මෙහෙයුම් හෝ පරීක්ෂා කිරීමට බලයලත් නිලධරයාට බලය තිබිය යුතු ය.

3. මෙහි අ උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වයසක දී යෝජනා ක්‍රමයට බැඳෙන ධීවරයකු විසින් -

(අ) එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව දක්වා ඇති මාසික වාරිකය; හෝ
(ආ) එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව දක්වා ඇති ත්‍රෛමාසික වාරිකය; හෝ
(ඇ) එම උපලේඛනයේ IV වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව දක්වා ඇති අර්ධ වාර්ෂික වාරිකය; හෝ
(ඈ) එම උපලේඛනයේ V වන තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිතව දක්වා ඇති යම් මුදලක් එකවර ගෙවීමක් වශයෙන්,

ගෙවනු ලැබිය යුතුය.

4. (1) 3 වන නියෝගයේ සඳහන් කරන ලද පරිදි දායක මුදල් ගෙවනු ලබන යම් දායකයකු විසින්, මෙහි ආ උපලේඛනයේ I වන තීරයේ සඳහන් නිශ්චිත වයස සම්පූර්ණ කිරීමත් සමඟ එහි II වන තීරයේ අනුරූපි සටහනෙහි නිශ්චිතව දක්වා ඇති මාසික විශ්‍රාම වැටුප ලැබීම සඳහා හිමිකම් ලබන්නේ ය.

(2) යම් දායකයකු විසින්, මෙහි අ උපලේඛනයේ I වන තීරයේ සඳහන් නිශ්චිත වයසට අදාළව, එම උපලේඛනයේ II වන තීරයේ හෝ III වන තීරයේ හෝ IVවන තීරයේ අනුරූපි සටහනේ දක්වා ඇති වාරික මුදලේ ගුණාකාර හෝ එහි V වන තීරයේ අනුරූපි සටහනේ දක්වා ඇති එකවර ගෙවනු ලබන දායකත්ව මුදලේ ගුණාකාර ගෙවීමෙන් හෝ මෙහි ආ උපලේඛනයේ I වන තීරයේ සඳහන් නිශ්චිත වයස සම්පූර්ණ කිරීමත් සමඟ, එහි II වන තීරයේ අනුරූපි සටහනෙහි නිශ්චිතව දක්වා ඇති මාසික විශ්‍රාම වැටුප ලෙස දක්වා ඇති මුදලේ ගුණාකාර මාසික විශ්‍රාම වැටුපක් ලෙස ලැබීම සඳහා හිමිකම් ලබන්නේ ය.

(3) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හෝ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විමසීමෙන් පසු, මෙහි අ උපලේඛනයේ සඳහන් නිශ්චිත වයසට අදාළ වාරික මුදලේ ගුණාකාරය පදනම් කරගනිමින් මෙහි ආ උපලේඛනයේ I වන තීරයේ සඳහන් නිශ්චිත වයස සම්පූර්ණ කිරීමත් සමඟ එහි II වන තීරයේ අනුරූපි සටහනේ නිශ්චිතව සඳහන්, විශ්‍රාම වැටුපේ හිමිකම්පෑමට හැකියාවක් ඇති එහි ගුණාකාරයන්ගේ අවම සහ උපරිම සීමා පැනවීමට මණ්ඩලයට බලය ඇත.

5. (1) සෑම දායකයකු විසින් ම ඒ දායකයා වෙත නිකුත් කරන ලද සහතිකයේ නිශ්චිතව දක්වා ඇති දින හෝ ඊට පෙර හෝ මණ්ඩලය විසින් සහන කාලසීමාවක් ප්‍රදානය කරනු ලැබුවහොත් එකී කාලසීමාව ඉකුත්වීමට පෙරාතුව හෝ එම දායකයාගෙන් අයවිය යුතු වාරික මුදල් ගෙවනු ලැබිය යුතු ය.

(2) යම් දායකයකු විසින් වාරික මුදල් ගෙවිය යුතු දිනට පෙර ඕනෑම වාරික සංඛ්‍යාවක් ගෙවනු ලැබිය හැකි ය.

6. (1) යම් දායකයකු විසින් අනුගාමී වාරික දහයක් ගෙවීම පැහැර හරිනු ලබන්නේ නම්, ඔහු වෙත නිකුත් කරන ලද සහතිකයේ කාලය ඉකුත් වී ඇති බවට සලකනු ලැබිය යුතු අතර, එවැනි අවස්ථාවක දී, ඔහු විසින් යෝජනා ක්‍රමය යටතේ වන යම් ප්‍රතිලාභ ලැබීම සඳහා හිමිකම් නොලබන්නේ ය.

(2) යම් දායකයකු විසින් සහන කාලසීමාව ඉකුත්වීමෙන් පසු යම් වාරිකයක් ගෙවනු ලැබ ඇත්නම්, එම දායකයා විසින් එම වාරික මුදල ගෙවීම පැහැර හැර ඇති බවට සලකනු ලැබිය යුතු අතර, මේ නියෝග යටතේ නිශ්චය කරන ලද යම් නිශ්චිත සහනයක් හැර යම් ගෙවීමක් ලැබීම සඳහා හිමිකම් නොලබන්නේ ය.

(3) මණ්ඩලය විසින්, සහතිකයේ කාලය ඉකුත් වී ඇති දායකයකු වෙත ඔවුන්ගේ තීරණය පිළිබඳ ලිඛිත දැන්වීමක්, යවනු ලැබිය යුතු අතර, එවැනි යම් දායකයකු වෙත තම සහතිකය සඳහා වලංගුභාවය ලබා ගැනීමට එම දැන්වීම ලැබී මාසයක් ඇතුළත මණ්ඩලය වෙත අභියාචනා කිරීමේ අයිතිය සතු වේ.

7. (1) යම් දායකයකු විසින් 3 වන නියෝගයේ විධිවිධානවලට අනුකූලව, මුළු කාලසීමාව සඳහා යෝජනා ක්‍රමය යටතේ වාරික වශයෙන් ගෙවිය යුතු සමස්ත දායක මුදල් හෝ එකවර ගෙවනු ලබන මුදල ගෙවා ඇත්නම්, එම දායකයාහට වයස අවුරුදු හැට සම්පූර්ණවීමත් සමඟ මෙහි ආ උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති විශ්‍රාම වැටුප ලබා ගැනීමට හිමිකම් ලබන්නේ ය.

(2) යෝජනා ක්‍රමයට බැඳීමෙන් පසු යම් දායකයකු විසින් දායක මුදල් ගෙවීම ආරම්භ කර ඇත්නම්, අදාළ දායක මුදල් සම්පූර්ණයෙන් ගෙවීමෙන් පසු හා යෝජනා ක්‍රමයට බැඳුණු දින සිට අවුරුදු පහක් සම්පූර්ණවීමෙන් පසු ඔහු විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන්නේ ය.

(3) යම් දායකයකු විසින්, පනත යටතේ ඔහු වෙත නිකුත් කරන ලද සහතිකය ප්‍රකාර, එම දායකයා විසින් ගෙවිය යුතු සමස්ත දායක මුදලින් සියයට විසිපහකට (25%) වඩා අඩු ප්‍රමාණයක් ගෙවා ඇත්නම්, ඔහු විශ්‍රාම වැටුපකට හෝ ඔහු විසින් ගෙවන ලද සමස්ත දායක මුදල හෝ එහි කොටසක් හෝ ආපසු ලබා ගැනීමට හිමිකම් නොලබන්නේ ය.

(4) යම් දායකයකු විසින්, පනත යටතේ ඔහු වෙත නිකුත් කරන ලද සහතිකය ප්‍රකාර, ඔහුගේ සහතිකයේ කාලය ඉකුත් වී ඇති බවට සලකනු ලබන දිනයේ දී ඔහු විසින් ගෙවිය යුතු සමස්ත දායක මුදලෙන් සියයට විසිපහක් (25%) සහ සියයට හැත්තෑපහක් (75%) අතර මුදලක් ගෙවා ඇත්නම්, එම දායකයා, ඔහු විසින් ගෙවන ලද දායක මුදල් ප්‍රමාණය සහ පරිපාලන වියදම් සඳහා මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ප්‍රතිශතයක් අඩු කිරීමෙන් පසු මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පොළී මුදල ආපසු ලබා ගැනීමට හිමිකම් ලබන්නේ ය.

(5) යම් දායකයකු විසින්, පනත යටතේ ඔහු වෙත නිකුත් කරන ලද සහතිකය ප්‍රකාර, ඔහුගේ සහතිකයේ කාලය ඉකුත් වී ඇති බවට සලකනු ලබන දිනයේ දී ඔහු විසින් ගෙවිය යුතු සමස්ත දායක මුදලින් සියයට හැත්තෑ පහක් (75%) හෝ ඊට වැඩි ප්‍රමාණයක් ගෙවා ඇත්නම් ඔහු, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන සමානුපාතික විශ්‍රාම වැටුපක් ලැබීම සඳහා හිමිකම් ලබන්නේ ය.

8. (1) යෝජනා ක්‍රමයේ යම් දායකයකු විසින්, යෝජනා ක්‍රමයට යම් අතිරේක දායක මුදල් ගෙවීමකින් තොරව ආබාධිත බවට පත්වීම සම්බන්ධයෙන් වන ප්‍රතිලාභවලට සහ මරණ පාරිතෝෂිකයට හිමිකම් ලැබිය යුතු ය.

(2) යෝජනා ක්‍රමයට බැඳුණු යම් දායකයකු විසින්, යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට සුදුස්සකු බවට පත්වීමට පෙරාතුව මරණයට පත්වන්නේ නම් හෝ අර්ධ හෝ පූර්ණ ආබාධිත බවට පත්වන්නේ නම් -

(අ) එම දායකයා -

(i) මෙහි ඇ උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වයසේ දී ස්ථිර පූර්ණ ආබාධිත බවට පත්වූ විට, එම උපලේඛනයේ II වන තීරයේ අනුරූපි සටහනේ නිශ්චිතව දක්වා ඇති එකවර ගෙවනු ලබන මුදල් පාරිතෝෂිකයක් ලැබීම සඳහා;

(ii) මෙහි ඇ උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වයසේ දී ස්ථිරව සහ අර්ධ ආබාධිත බවට පත්වූ විට, එම උපලේඛනයේ III වන තීරයේ අනුරූපි සටහනේ නිශ්චිතව දක්වා ඇති එකවර ගෙවනු ලබන මුදල් පාරිතෝෂිකයක් ලැබීම සඳහා;

හිමිකම් ලබන්නේ ය.

(ආ) යම් දායකයකු මෙහි ඇ උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වයසේ දී මරණයට පත් වූ විට, ඔහුගේ නිත්‍යානුකූල උරුමකරුවන් එම උපලේඛනයේ IV වන තීරයේ අනුරූපි සටහනේ නිශ්චිතව දක්වා ඇති මරණ පාරිතෝෂිකයක් සඳහා හිමිකම් ලබන්නේ ය.

(3) (2) වන අනු නියෝගයේ සඳහන් එකවර ගෙවනු ලබන මුදල් පාරිතෝෂිකය යම් දායකයකුගේ ජීවිත කාලය තුළ එක වරක් පමණක් ගෙවනු ලැබිය යුතු අතර, අබලතාවය පහත දැක්වෙන සිදුවීම්වලින් යම් සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූවක් විය යුතු ය -

(අ) සහතිකයේ උපලේඛනයේ සඳහන්, සහතිකය බලාත්මක වන දිනයට පසුව ඇතිවන්නා වූ ද, බාහිර හිංසාවක් නිසා සිදුවන්නා වූ ද යම් හදිසි අනතුරක්, තව ද ඒ ආබාධිත තත්ත්වය ඒ හදිසි අනතුර සිදුවීමෙන් දින අනූවක් (90) ක් ඇතුළත ඇති විය යුතු ය; හෝ

(ආ) සහතිකය බලාත්මක වන දිනයට පසුව ඇති වූ රෝගී තත්ත්වයක්.

(4) පනත යටතේ යම් දායකයකු වෙත සහතිකය නිකුත් කරනු ලැබූ දින සිට වසරක් ගතවීමෙන් පසුව පමණක් (2) වන අනු නියෝගයේ සඳහන් එකවර ගෙවනු ලබන මුදල් පාරිතෝෂිකය ලැබීම සඳහා යම් දායකයකු හිමිකම් ලබන්නේ ය.

(5) අර්ධ හෝ පූර්ණ සහ ස්ථිර ආබාධිත තත්ත්වයකින් පීඩා විඳිමින් සිටින දායකයකු එකවර ගෙවනු ලබන මුදල් පාරිතෝෂිකයේ සම්පූර්ණ මුදල් ප්‍රමාණය සහ එම දායකයා විසින් ගෙවනු ලැබූ දායක මුදල්වල සම්පූර්ණ ප්‍රමාණය හා ඒ මත මණ්ඩලය විසින් නිශ්චය කරන ලද පොලිය ද සමඟ ලබා ගැනීමට සුදුසුකම් ලබන අතර, එසේ ප්‍රතිලාභ ලබා ගැනීම මත යෝජනා ක්‍රමයේ ඔහුගේ සාමාජිකත්වය අවසන් වන්නේ ය.

(6) (5) වන අනු නියෝගයේ සඳහන් එකවර ගෙවනු ලබන මුදල් පාරිතෝෂිකය පමණක් ලබා ගැනීමෙන් පසු යෝජනා ක්‍රමයේ සාමාජිකයකු වශයෙන් දිගටම රැඳීසිටීමට අපේක්ෂා කරනු ලබන දායකයකුට, ඔහු විසින් ගෙවිය යුතු වාරික මුදල් ගෙවීමෙන් යෝජනා ක්‍රමයේ තවදුරටත් රැඳී සිටීමට අයිතිය ඇත.

(7) යම් දායකයකුගේ මරණය පහත දැක්වෙන යම් සිදුවීමක ඍජු හෝ වක්‍ර ප්‍රතිඵලයක් වන්නේ නම් (2) වන අනු නියෝගයේ සඳහන් මරණ පාරිතෝෂිකය ගෙවනු නොලැබිය යුතු ය -

(අ) යුද්ධය, ආක්‍රමණය, පරසතුරු ක්‍රියා, ප්‍රකාශ කරන ලද හෝ නොකරන ලද යුදමය අවස්ථාවක දී ඇති වන සතුරු ක්‍රියා, සිවිල් යුද්ධය, කැරැල්ල, විප්ලවය හෝ බලයෙන් පහ කිරීම; හෝ

(ආ) පිළිගත් ගුවන් සමාගමකට අයත් ගුවන් යානයක ගාස්තු ගෙවූ මගියකු වශයෙන් දායකයා ගමන්ගත් අවස්ථාවක දී හැර, දායකයා ගුවන් තරණයෙහි හෝ ගුවන් යානා හැසිරවීමෙහි හෝ වෙනත් යම් ආකාරයක ගුවන් ගමනක යෙදීම; හෝ

(ඇ) දායකයා හට පනත යටතේ සහතිකය නිකුත් කිරීමෙන් පසුව දැනුවත්ව හෝ නොදැනුවත්ව සිය දිවි හානි කර ගැනීම; හෝ

(ඈ) මත්පැන්, මත්ද්‍රව්‍ය හෝ මත් ඖෂධවල බලපෑම යටතේ සිටින අතරතුර දායකයා විසින් සිදු කරනු ලබන ක්‍රියා; හෝ

(ඉ) දායකයා විසින් නීති විරෝධි ක්‍රියාවක් සිදු කරමින් සිටින අතරතුර හෝ එවැනි යම් ක්‍රියාවක් සිදු කිරීම නිසා නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ භාරයේ සිටින අතරතුර.

(8) දායකයාගේ මරණය හදිසි අනතුරක් හේතුවෙන් සිදු වූ අවස්ථාවක දී හැර පනත යටතේ දායකයා වෙත සහතිකය නිකුත් කරනු ලැබූ දින සිට වසරක කාලයක් ඉකුත්වීමෙන් පසුව පමණක් එම දායකයාගේ නිත්‍යානුකූල උරුමකරුවන් මරණ පාරිතෝෂිකය සඳහා හිමිකම්පෑමට සුදුස්සන් බවට පත් වන්නේ ය.

(9) යම් දායකයකු මිය යාමෙන් පසු, මරණ පාරිතෝෂිකයට අමතරව මියගිය දායකයා විසින් ගෙවනු ලැබූ දායක මුදල්වල සම්පූර්ණ ප්‍රමාණය සමග ඒ මත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පොළිය ද ලබා ගැනීමට දායකයාගේ යම් නිත්‍යානුකූල උරුමකරුවන් හිමිකම් ලබන්නේ ය.

9. (1) (අ) මණ්ඩලයේ තීරණයක් මත සහතිකය අවසන් කිරීම; හෝ

(ආ) මෙම නියෝගය යටතේ වන මණ්ඩලයේ යම් තීරණයක්,

පිළිබඳව අතෘප්තියට පත් වූ යම් දායකයකු විසින් එම තීරණය දායකයා වෙත ලැබුණු දින සිට දින තිහක් (30) ඇතුළත අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන අනු නියෝගය යටතේ කරන ලද අභියාචනයක් මණ්ඩලය විසින් නිශ්චිතව දක්වන ලද ආකෘතියෙන් තිබිය යුතු අතර, තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් බලය දෙනු ලබන නිලධරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

10. යෝජනා ක්‍රමයේ ආයෝජන ආදායමෙන් සියයට දෙකක (2%) ප්‍රමාණයක් යෝජනා ක්‍රමයේ පරිපාලන වියදම් සඳහා ලබා ගැනීමට මණ්ඩලයට හිමිකම් ඇත.

11. 1996 සැප්තැම්බර් මස 09 වැනි දින අංක 940/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1995 අංක 1 දරන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නියෝගවල -

"පනත" යන්නෙන්, 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත අදහස් වේ;

"කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය" යන්නෙන්, 1999 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය අදහස් වේ;

"නීත්‍යානුකූල උරුමකරු" යන්නෙන්, දායකයාගේ ජීවත්ව සිටින භාර්යාව හෝ ස්වාමිපුරුෂයා හෝ දායකයාට ඥාතීන් එක් අයකුට වඩා සිටින අවස්ථාවක පනතේ උපලේඛනයේ දක්වා ඇති ප්‍රමුඛතා අනුපිළිවෙලින් බාල අයට පෙර වැඩිහිටි අයට ප්‍රමුඛත්වය දෙමින් දායකයාගේ ජීවත්ව සිටින ඥාතීන්ගෙන් එක් අයකු අදහස් වේ;

"ස්ථිර අර්ධ ආබාධිත බව" යන්නෙන්,

(i) එක් ඇසක පෙනීම අහිමිවීම; හෝ
(ii) එක් අතක් අහිමිවීම; හෝ
(iii) එක් පාදයක් අහිමිවීම;

අදහස් වේ;

"ස්ථිර පූර්ණ ආබාධිත බව" යන්නෙන්,

(i) අත් දෙකම අහිමිවීම; හෝ
(ii) දෙපයම අහිමිවීම; හෝ
(iii) ඇස් දෙකෙහිම පෙනීම අහිමිවීම; හෝ
(iv) එක් අතක් හා එක් පාදයක් අහිමිවීම; හෝ
(v) එක් පාදයක් අහිමිවීම හා එක් ඇසක පෙනීම අහිමිවීම; හෝ
(vi) එක් අතක් අහිමිවීම හා එක් ඇසක පෙනීම අහිමිවීම; හෝ
(vii) බෙල්ලට පහළ කොටස සම්පූර්ණයෙන් අප්‍රාණිකවීම.

අදහස් වේ;

**අ උපලේඛනය**

**(3 වන, 4 වන නියෝග)**

| මූලික විශ්‍රාම වැටුප ලබා ගැනීම සඳහා අදාළ වයස අනුව දායකයා විසින් ගෙවිය යුතු වාරිකය | | | | |
|---|---|---|---|---|
| I වන තීරය | II වන තීරය | III වන තීරය | IV වන තීරය | V වන තීරය |
| යෝජනා ක්‍රමයට බැඳීමෙන් පසු ඊළඟ උපන් දිනයේ දී වයස | මාසික දායක මුදල (රු.) | ත්‍රෛමාසික දායක මුදල (රු.) | අර්ධ වාර්ෂික දායක මුදල (රු.) | එකවර ගෙවන දායක මුදල (රු.) |
| 18 | 40 | 120 | 235 | 5,285 |
| 19 | 45 | 130 | 255 | 5,770 |
| 20 | 50 | 145 | 280 | 6,295 |
| 21 | 55 | 155 | 305 | 6,870 |
| 22 | 60 | 170 | 335 | 7,500 |
| 23 | 65 | 185 | 365 | 8,185 |
| 24 | 70 | 205 | 400 | 8,930 |
| 25 | 75 | 225 | 440 | 9,745 |
| 26 | 85 | 250 | 485 | 10,630 |
| 27 | 90 | 270 | 530 | 11,600 |
| 28 | 100 | 300 | 580 | 12,660 |
| 29 | 110 | 325 | 640 | 13,815 |
| 30 | 120 | 360 | 705 | 15,075 |
| 31 | 135 | 395 | 770 | 16,450 |
| 32 | 145 | 435 | 850 | 17,950 |
| 33 | 160 | 480 | 935 | 19,585 |
| 34 | 180 | 530 | 1,035 | 21,375 |
| 35 | 195 | 580 | 1,140 | 23,330 |
| 36 | 215 | 640 | 1,260 | 25,465 |
| 37 | 240 | 715 | 1,395 | 27,795 |
| 38 | 265 | 790 | 1,545 | 30,350 |
| 39 | 295 | 875 | 1,715 | 33,140 |
| 40 | 325 | 975 | 1,910 | 36,190 |
| 41 | 365 | 1,085 | 2,130 | 39,535 |
| 42 | 405 | 1,215 | 2,380 | 43,190 |
| 43 | 455 | 1,360 | 2,665 | 47,200 |
| 44 | 510 | 1,530 | 2,995 | 51,590 |
| 45 | 575 | 1,725 | 3,380 | 56,410 |

අ උපලේඛනය *(සම්බන්ධිතයි)*

| | | | | |
|---|---|---|---|---|
| 46 | 650 | 1,950 | 3,825 | 61,695 |
| 47 | 740 | 2,220 | 4,355 | 67,505 |
| 48 | 850 | 2,540 | 4,985 | 73,890 |
| 49 | 975 | 2,925 | 5,740 | 80,910 |
| 50 | 1,135 | 3,400 | 6,665 | 88,645 |
| 51 | 1,330 | 3,985 | 7,815 | 97,170 |
| 52 | 1,575 | 4,730 | 9,270 | 106,575 |
| 53 | 1,900 | 5,695 | 11,170 | 116,970 |
| 54 | 2,335 | 7,005 | 13,730 | 128,465 |
| 55 | 2,955 | 8,855 | 17,355 | 141,195 |

**ආ උපලේඛනය**

**(4 වන, 7 වන නියෝග)**

| I වන තීරය | II වන තීරය |
|---|---|
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබන වයස් පරාසය | මාසික විශ්‍රාම වැටුප |
| 60 - 63 | 1,000 |
| 64 - 70 | 1,250 |
| 71 - 77 | 2,000 |
| 78 ට වැඩි | 5,000 |

**ඇ උපලේඛනය**

**(8 වන නියෝගය)**

| I වන තීරය | II වන තීරය | III වන තීරය | IV වන තීරය |
|---|---|---|---|
| අබලතාවයකට පත්වීම හෝ මරණයට පත්වීමේ දිනෙන් පසු ඊළඟ එළඹෙන උපන් දිනයේ දී වයස | ස්ථිර පූර්ණ ආබාධිත බව | ස්ථිර අර්ධ ආබාධිත බව | මරණය |
| අවුරුදු | (රු.) | (රු.) | (රු.) |
| 30 දක්වා | 50,000 | 25,000 | 25,000 |
| 31 - 35 | 40,000 | 20,000 | 20,000 |
| 36 - 40 | 30,000 | 15,000 | 15,000 |
| 41 - 45 | 20,000 | 10,000 | 10,000 |
| 46 - 50 | 12,000 | 6,000 | 6,000 |

EOG 03– 0174

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.